# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2329/34 - 2023 අප්‍රේල් මස 26 වැනි බදාදා - 2023.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DSM/DB/LND/4/SA-i.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/2/2018/S/197.

පන්නම්පිටිය සමෘද්ධි ප්‍රජාමූල බැංකුව සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පන්නම්පිටිය අංක ඊ441A පන්නම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ, පන්නම්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 310074 කලාප අංක 02, පත්‍ර අංක 10 හා 2023.01.05 දිනැති සැලසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල (කැබලි 1 ක්)

**01. කැබලි අංක 02**

ඉඩමේ නම: කඩේවත්ත, ඉහල්තනහේන්යාය සහ කලෝගහයාය; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 3ක් ඇත; හිමිකම් කියන අය: කාලිංග සෙනවිරත්න කුමාරසිංහ බණ්ඩාරනායක මුදියන්සේලැ ලේනාවල වලව්වේ කාලිංග බංඩාර ලේනාවල, කාලිංග සෙනවිරත්න කුමාරසිංහ බණ්ඩාරනායක මුදියන්සේලැ ලේනාවල වලව්වේ පුෂ්පා කුමාරිහාමි, කාලිංග සෙනවිරත්න කුමාරසිංහ බණ්ඩාරනායක මුදියන්සේලැ ලේනාවල වලව්වේ ලයනල් බංඩාර ලේනාවල, කාලිංගරත්න දෙහිගම, නවරත්න මුදියන්සේලාගේ බිසෝමැණිකේ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0290.

ඉහත සඳහන් ඉඩමට /පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2023.05.25 වැනි දින පෙ.ව. 10.00ට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.05.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/පරවශ්‍යතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ඉඩම් පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**පියල් ජයසූරිය,**
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2023 අප්‍රේල් මස 20 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0184



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*